# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 නොවැම්බර් මස 10 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2023.11.13 දින නිකුත් කරන ලදී)**

**රාජිත සේනාරත්න පදනම (සංස්ථාගත කිරීමේ)**

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**රාජිත සේනාරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# රාජිත සේනාරත්න පදනම
# (සංස්ථාගත කිරීමේ)

## රාජිත සේනාරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"රාජිත සේනාරත්න පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව, එකී පදනමේ පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද;

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක    දරන රාජිත සේනාරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රාජිත සේනාරත්න පදනම සංස්ථාගත කිරීම

**2.** (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "රාජිත සේනාරත්න පදනමේ" දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රාජිත සේනාරත්න පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කළ හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන ආකාරයෙන් විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) නාගරිකව කේන්ද්‍ර වී ඇති සම්පත් ග්‍රාමීය මට්ටමට ව්‍යාප්ත කිරීම සඳහා කළුතර දිස්ත්‍රික් සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීම;

(ආ) කළුතර දිස්ත්‍රික්කයේ අවශ්‍යතා, ගැටලු, සම්පත් වෙළඳපළ හඳුනාගැනීම හා ඒ මත පදනම් වූ සුළු කර්මාන්ත ව්‍යුහයක් කළුතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ සහභාගිත්වයෙන් ගොඩනැගීම;

(ඇ) කළුතර දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික අංශ සම්බන්ධ කර ගනිමින් ඒකාබද්ධ ආර්ථික සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම;

(ඈ) කළුතර දිස්ත්‍රික්කයේ පවතින සෞඛ්‍ය හා ආනුෂංගික ගැටලු විසඳීම සඳහා වෛද්‍ය සායන හා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඉ) පරිසර සුරක්ෂිතතා කටයුතු ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ස්වයං රැකියා වැඩසටහන් ආරම්භ කිරීම, දැනුම ලබා දීම, ස්වයං රැකියා ව්‍යාපෘතිවල යෙදීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් ආධාර දීම හෝ ඔවුන්ගේ නිෂ්පාදන විකුණා ගැනීමට සැලැස්වීම සහ මිල දී ගැනීම;

(උ) යෞවනයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ව්‍යාපාරික ව්‍යවසායන් ආරම්භ කිරීම, ස්වයං රැකියා ව්‍යාපෘතිවල යෙදීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් ආධාර දීම හෝ ඔවුන්ගේ නිෂ්පාදන විකුණා ගැනීම සහ වෙළඳසැල් පවත්වාගෙන යාම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශනා, සම්මන්ත්‍රණ, සාකච්ඡා සහ සංදර්ශන පැවැත්වීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ දරන වෙනත් සමාගම්, සංවිධාන හෝ සමිති සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ බලතල

**4.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන නිලධරයන් සහ වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරූ පදනමේ විධායක කාරක සභාව, සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති

**6.** (1) සංස්ථාවේ යම් සභා රැස්වීමක දී එයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයින් විසින් ගෙවිය යුතු ගාස්තු සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය අත් හැරීම හෝ ඔවුන් ධුරයෙන් පහකිරීම සහ ඔවුන්ගේ බලතල, කටයුතු සහ කාර්යය;

(ඇ) විධායක කාරක සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල, කාර්යය, කටයුතු සහ විධායක කාරක සභා සාමාජිකයන්ගේ ධුර කාලය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කටයුතු, කාර්ය සහ කර්තව්‍යය;

(ඉ) විධායක කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාව, ස්ථානය සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් හා ඒ රැස්වීම්වල න්‍යාය පත්‍රය සහ ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එයට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්

**7.** මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට හා

දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව හා බලය ලැබී ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතුය. ත්‍යාග හෝ රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව වෙත හෝ සංස්ථාව වෙනුවෙන් ලැබෙන මුදල්, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

සංස්ථාවේ මුද්‍රාව

**10.** සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහිම තම නම් අත්සන් කරනු ලැබිය යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තෙකු විසින් කරන අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.